## ලුණුගල ප්‍රාදේශිය සභාව 2022.05.24 වන දින පැවති
## මාසික මහ සභා රැස්වීම් වාතර්ාව

2022 මැයි මස මාසික මහ සභා රැස්වීම 2022.05.24 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

**මෙදින පැමිණීම,**

1. ගරු සභාපති — චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා
2. ගරු උප සභාපති — ධම්මලිංගම් සෙල්වරාණි මැතිනිය
3. ගරු මන්ත්‍රී — මොහොම්මදු ජෙමීල් මෙහොම්මදු ජරෝ මැතිතුමා
4. ගරු මන්ත්‍රී — පෙරියසාමි ලෝගනාදන් මැතිතුමා
5. ගරු මන්ත්‍රී — පලනියන්ඩි සුබ්‍රමනියම් මැතිතුමා
6. ගරු මන්ත්‍රී — ශ්‍රී හස්ත ලේකම්ලාගේ චන්දන සමන් කුමාර මැතිතුමා
7. ගරු මන්ත්‍රී — සුමනාවති මැතිනිය
8. ගරු මන්ත්‍රී — ජෙයකුමාර් පරමසිවම් මැතිතුමා
9. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ අසංක විජේබංඩාර මැතිතුමා
10. ගරු මන්ත්‍රී — පතිරණගේ කුමාරසිරි සමරවීර මැතිතුමා
11. ගරු මන්ත්‍රී — රාමන් ජේයශංකර් මැතිතුමා
12. ගරු මන්ත්‍රී — මුරුගයියා ගනේෂමූතර්ී මැතිතුමා
13. ගරු මන්ත්‍රී — රෙන්ගසාමි කනගසුන්දරි මැතිනිය
14. ගරු මන්ත්‍රී — රත්නායක මුදියන්සේලාගේ සිරියාවති මැතිනිය
15. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ තිලකසිරි දිසානායක මැතිතුමා
16. ගරු මන්ත්‍රී — මාපා බණ්ඩාරලාගේ සමන් කුමාර මැතිතුමා
17. ගරු මන්ත්‍රී — රාජේන්ද්‍රන් මහාදේවි මැතිනිය
18. ගරු මන්ත්‍රී — වික්‍රමසිංහ ආරච්චි පතිරණලාගේ අනුර වික්‍රමතුංග මැතිතුමා
19. ගරු මන්ත්‍රී — රාජපක්ෂ වත්තේ විදානේලාගේ ඇඩ්වින් මැතිතුමා
20. ගරු මන්ත්‍රී — අබේකෝන් මුදියන්සේලාගේ ජයවීර අබේකෝන් මැතිතුමා

**න්‍යාය පත්‍රයට අනුව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය**

ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමාගේ ඉල්ලීමට අනුව පසුගිය දිනෙක අමානුෂික ලෙස පහරදීමකින් මියගිය පොළොන්නරුව දිස්ත්‍රික් ගරු පාලර්ිමේන්තු මන්ත්‍රී අමරකීතර්ී අතුකෝරාළ මැතිතුමා

හා නිපරාක්ෂික අරගලයෙන් ජීවිතය පූජා කළ යම් අයෙක් වේ නම් ඔවුන් ද සිහි කරමින් විනාඩි 02ක නිශ්ශබ්දතාවයක් පැවැත්වීය.

**01. පසුගිය සභා වාතර්ාව සභා සම්මත කර ගැනීම (2022.04.26 වන දින)**

**01/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

පසුගිය සභා වාතර්ාවෙහි සදහන් මා විසින් ප්‍රකාශ කරන ලද පසුගිය දිනෙක ලුණුගල ඉන්ධන පිරවුම්හලෙහි ඉන්ධන බෙදාහැරීම් කටයුතු වලදී අනවශ්‍ය ලෙස මැදිහත්වෙමින් ගැටළුවක් මතු කරලීමට දායකත්වය ලබා දුන් ලුණුගල පොලිස් ස්ථානාධිපතිතුමා පිළිබදව වාතර්ාවේ සදහන් වනුයේ පොලිස් නිළධාරිතුමා යනුවෙනි. එය O.I.C. බාලසූරිය මහතා යනුවෙන් සංශෝධනය විය යුතු බව පැවසීය.

එසේම ජල ව්‍යාපෘතියේ රැකියා ලබා දීම පිළිබදව වාතර්ාවේ සදහන් වී ඇත්තේ එම රැකියා ලබා දී ඇත්තේ නගර කොට්ඨාශය තුල බවයි. නමුත් එය නගර කොට්ඨාශයෙන් බාහිරව යනුවෙන් සංශෝධනය විය යුතුය.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා.**

පසුගිය සභා වාතර්ාවෙහි මා විසින් ප්‍රකාශ කරනු ලැබුවේ හිඟ ජල ගාස්තු ජනතාව වෙත විශාල බරක් ලෙස පැටවී ඇති බවයි. නමුත් වාතර්ාවේ සදහන් වී ඇත්තේ මාසික බිල් කිරීම් ජනතාව වෙත විශාල බරක් ලෙස පැටවී ඇති බවයි. එය සංශෝධනය විය යුතුය.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

ලුණුගල බස්නැවතුම්පලේ ඉහල මහලේ දැනට හිස්ව ඇති කඩකාමරය පෞද්ගලික බස්රථ නියාමන කායර්ාලයක් පවත්වාගෙන යාමට ලබා දෙන ලෙස පසුගිය සභා වාරයේදී සාකච්ඡා වූ බවට වාතර්ාවේ සදහන් වන නමුත් ඒ පිළිබදව සභාවේ සාකච්ඡා වී නොමැත. එසේම මා විසින් ඉල්ලුම් කරනු ලැබුවේ ජනතාවගේ ගමන් පහසුව උදෙසා පුද්ගලික ආයතනයක් මඟින් ලුණුගල සිට කොළඹ දක්වා පුද්ගලික බස් රථයක් ධාවනය සදහා එක් කිරීමට අපේක්ෂාවෙන් සිටින බවත් ඒ සදහා අවසර ලබා දෙන ලෙසත් පමණි.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා.**

සභාව සතු හිස්ව ඇති කඩකාමර එලෙස කායර්ාල පවත්වාගෙන යාමට ලබා දීම පිළිබදව මාගේ විරෝධතාවය පළ කර සිටින අතර, එසේ ලබා දෙන්නේ නම් විධිමත් ලෙස ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් මඟින් ලබා දීම සුදුසු බව මගේ හැඟීමයි.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

පසුගිය සභා වාතර්ාවේ 05/01/14 යෝජනාව ස්ථිර කරනු ලැබුවේ මා විසින් වුවත් එහි සදහන්ව ඇත්තේ ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමාගේ නම වන අතර එය සංශෝධනය විය යුතුය.

එසේම පසුගිය සභා වාතර්ාවේ 10 වන පිටුවේ 05/02 යෝජනාව සභාවේ ස්ථිරත්වයට පත් වූ නමුත් ඒ පිළිබදව සදහන්ව නොමැති අතර එය සංශෝධනය විය යුතුය.

එසේම මා විසින් ජාත්‍යන්තරය දක්වා සාධනීය යෝජනා ඉදිරිපත් කර ඇති බව වාතර්ාවේ සදහන් වන අතර ඒ සදහා ඉදිරියේදි අවස්ථාව ලබා ගැනීමට අදහස් කරනු බවත් සභාවට දන්වා සිටිනු කැමැත්තෙමි.

**2022.04.26 වන දින පැවති මහ සභා රැස්වීම් වාතර්ාව ඉහත සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බවට සභා සම්මත විය යුතු බව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාතර්ාව ඒකමතිකව සම්මත විය.**

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන :-**

1. රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව අංක 03/2022 දරණ චක්‍රලේඛය සභාගත කිරීම

**03. සංදේශ/ පෙත්සම්/ පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමවීර මැතිතුමා.**

**03/1.** මා විසින් පසුගිය සභා වාරයේදී ඉදිරිපත් කළ සුළු යෝජනා හෝ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

පාසල් මාවත ද අදාළ වන සේ පල්ලේපංගුව ගමට පිවිසීමට ඉදි කරනු ලැබූ පාලමෙහි තීන්ත අලේප කිරිම පිළිබඳව කාමරීක නිළධාරිතුමාගෙන් වාතර්‍ාවක් කැඳවා ඇති අතර එම වාතර්‍ාව ලද පසු අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරමි.

තොරණක් ඉදි කිරිම සඳහා පාක්වත්ත මංසන්දියේ අත්තිවාරම් කපා ඇති අනාරක්ෂිත වලවල් 02 වටා කඩිනමින් වැටක් සවි කර ආරක්ෂිත කිරිමට එම අවස්ථාවේදීම සේවකයින් 02කු යොදවා අවශා කටයුතු සිදු කිරිමට සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

ගරු මන්ත්‍රී පි.සුබ්‍රමනියම් මැතිතුමාගේ ප්‍රතිපාදන මත ලුණුගල මහ රෝහල සඳහා ලබා දුන් ජල පෙරන 02 සඳහා ජල සම්බන්ධතා ලබා දීමට කාමරීක නිළධාරිතුමා සමඟ සේවකයින් 02කු එම අවස්ථාවේදීම ලුණුගල රෝහල වෙත යොදවන ලදි.

**03/2.** ලුණුගල නගරයේ ස්ථාපිත කොට ඇති තැපැල් පෙට්ටියේ තීන්ත ආලේප කොට සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිමි.

**03/3.** ලුණුගල, එල්රෝඩ් හි පදිංචි ටි.කුමාර් මහතා රටේ කාලීන අවශාතාවයට සරිලන ලෙස කිරි එළදෙනුන් ඇති කරමින් දෛනික කිරි අවශාතාවය සපුරා ගැනිම මෙන්ම බැහැරලන අපද්‍රවා උපයෝගි කොට ගනිමින් ජීව වායුව උත්පාදනය කරමින් සිය දියණියගේ නිවසට මෙන්ම අසල්වැසි නිවසෙහි බලශක්ති අවශාතාවය සපුරා ගැනිමට කටයුතු කොට ඇත. රාජා නොවන සංවිධානයකින් ආධාර කොට ඇති අතර අතර තමාට සහය දක්වන ලෙස බොහෝ ආයතන වෙත ඉල්ලීම් කොට තිබුනද ඉන් කිසිවකින් දායකත්වය නොලැබුන බවත් එතුමා ප්‍රකාශ කොට ඇත.

ඒ අනුව එතුමාගේ ඉල්ලිම වනුයේ තවත් කිරි එළදෙනුන් 02කු ලබා දීමට අවශා කටයුතු සළසා දෙන ලෙසය.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

එම අවස්ථාවේදීම වලර්ඩ් විෂන් ආයතනය ඇමතු අතර ඔවුන් විසින් එම මහතා වෙත සහයෝගය දැක්වීමට කැමැත්ත පළ කොට ඇති අතර ඒ පිළිබඳව දක්වමින් කඩිනමින් එම ආයතනයට ලිපියක් සකසන මෙන් සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**03/4**. පසුගිය දිනෙක ගල්වෙලගම පිහිටි කුඩා ජල විදුලි බලාගාරය නිරික්ෂණය සඳහා මා සහභාගි වූ අතර කිතුල් කමර්‍ාන්තය මුල් කොට ගනිමින් ජීවත්වන අහිංසක ගැමියන් 250 ක් පමණ ජීවත් වන ගම්මානයට පිවිසීමට ඇත්තේ අති දුෂ්කර ගමන් මාගර්‍යක් මතිනි. දරුවන් පාසල් කරා පැමිණිම ද මේ ඔස්සේ සිදු කරනු ලබන අතර ගැමියන්ගේ ඉල්ලීමක් වී ඇත්තේ එම අබලන් මාගර්‍ය ගමන් පහසුව ලබා ගැනිමට උචිත ලෙස සකස් කර දෙන ලෙසයි.

**<u>ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා</u>**

**03/6.** මඩොල්සිම මහජන පුස්තකාලය සඳහා සේවයට පැමිණිමේ කැමැත්ත පල කරමින් ඌවකැළේ පදිංචි ක්‍රිෂාන්තිනි මෙනවිය විසින් ලිපියක් යොමු කොට තිබෙනවා. එය සභා ගත කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

එම ලිපියේ පිටපතක් මා හටද ලබා දී තිබෙනවා.එය කඩිනමින් ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිමි.ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම මත මඩොල්සිම ප්‍රදේශයේ මහජන පුස්තකාලයක් ස්ථාපිත කරනු ලැබුවා. ඒ සඳහා වලර්ඩ් විෂන් ආයතනයෙන් කෝටි 1 ½ ක ප්‍රතිපාදන ද ලබා දි තිබුනා. ඒ පිළිබඳව එම ආයතනයට අපගේ ප්‍රණාමය හිමි විය යුතුයි. කෙසේ නමුත් එම ස්ථානය විවෘත කිරිමේ අවස්ථාව පිළිබඳව අප දැනුවත් කරනු ලැබුවේ නැත. එසේම මඩොල්සිම බල ප්‍රදේශයේ ගරු මන්ත්‍රිවරුන් හෝ දැනුවත් කොට නැත. ඒ පිළිබඳව මාගේ කණගාටුව ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

වලර්ඩ් විෂන් ආයතනය මඟින් ඊට පෙර දින මා දැනුවත් කරනු ලැබුවේ කඩිනමින් එම ස්ථානය විවෘත කොට ජනතා අයිතියට පත් කළ යුතු බවය. ඒ සඳහා විශේෂ උත්සවයක් පැවැත්වූයේ නැත. මේ සම්බන්ධව ඉදිරියේදී උත්සවයක් පැවැත්වීමට කටයුතු සූදානම් කරමු.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

එම ස්ථානය සඳහා අලුතින් කායර් මණ්ඩලය බඳවා ගත නොහැකි පසුබිමක එම සේවා ස්ථානයට ආසන්නයේ පදිංචි ස්ථිර සේවක පි.සමන්තිනි මහත්මිය හා ඇයට සහයක වශයෙන් ඌවකැලේ පදිංචි ක්‍රිෂාන්තිනි මෙනවිය සේවයට යොදවා ගැනිම වඩාත් සුදුසුය. එසේම මැටිගහතැන්න මහජන පුස්තකාලයේ දැනට වසර ගණනාවක් ස්වේච්ඡාවෙන් සේවයට පැමිණෙන ශ්‍යාමලි දිල්හානි මෙනවියද මඩොල්සිම මහජන පුස්තකාලයේ සේවයේ යෙදවිය හැකිය. පාඨක පැමිණිම අවම මට්ටමක පවතින මැටිගහතැන්න මහජන පුස්තකාලය සතියකට එක් දිනක් ජංගම සේවයක් වශයෙන් පවත්වා ගැනිම සුදුසු බවයි මගේ හැඟිම.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා</u>**

එදින එම අවස්ථාව පිළිබඳව ගරු සභාපතිතුමාට හා සභා ලේකම්තුමියට දුරකතනයෙන් විමසා සිටියා. වලර්ඩ් විෂන් ආයතනයෙන් අප ප්‍රදේශයට කෝටි 1 ½ ක ප්‍රතිපාදන ද ලබා දි තිබුනා. ඒ පිළිබඳව එම ආයතනයට අපගේ ප්‍රණාමය හිමි විය යුතුයි.ඒ වෙනුවෙන් උපහාර උත්සවයක් සංවිධානයට සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති නම් ඒ සඳහා මූල්‍යමය දායකත්වය දැරිමට මා සූදානම් බව ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ සඳහා උත්සවයක් සංවිධානය නොකල අතර යතුර භාර ගැනීමක් පමණක් එදින සිදු විය. ඒ සඳහා සභා ලේකම්තුමිය පමණක් සහභාගි වුවා.ඉදිරියේදී උත්සවාකාරයෙන් එම අවස්ථාව පැවැත්මට කටයුතු සූදානම් කරන්නම්. දැනට එම ස්ථානයේ කායර්ාලීය කටයුතු පමණක් සිදු කරනු ලබන අතර මාසයකින් පමණ පසු නිළධාරින් එම ස්ථානයට සේවයේ යොදවා රාජකාරි ආරම්භ කිරිමට නියමිතය.

**<u>ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා</u>**

එම අවස්ථාවට සහභාගි වන ලෙස දන්වමින් ගරු මන්ත්‍රිවරුන්ට ගරු සභාපතිතුමා දැනුම් දුන් බව ප්‍රකාශ කලද එය මා ප්‍රතික්ෂේප කරනු ලබනවා.මඩොල්සිම ප්‍රදේශයේ සභාව මැදිහත් වීමෙන් යම් කටයුත්තක් සිදු වනවා නම් ප්‍රදේශයේ මහජන නියෝජිතයින් වශයෙන් අප මුලින්ම දැනුවත් කළ යුතු වනවා.වලර්ඩ් විෂන් ආයතනය මඟින් ගොඩනැගිල්ල ඇතුලු සම්පත් ලබා දුන්න ද ඊට අදාළ ඉඩම නිදහස් කර ගැනීමට ඔබතුමාට අපගේ සහයෝගය ලබා දුන්නා. කෙසේ නමුත් එම පරිශ්‍රය විවෘත කිරිමේ අවස්ථාව අප හට දැනුම් නොදිම පිළිබඳව මාගේ කණගාටුව ප්‍රකාශ කරමි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා</u>**

මඩොල්සිම වෙළඳ සංගමයේ සභාපතිතුමාටද එම අවස්ථාවට සහභාගි විමට ආරාධනා කොට තිබුනා.එසේම ගරු උප සභාපතිතුමියට මේ පිළිබඳව වගකීමක් තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා</u>**

මෙහි වගකීම ගරු උපසභාපතිතුමිය විසින් භාර ගත යුතුය.අප ප්‍රාදේශිය සභාවේ මූලිකත්වයෙන් යම් කායර්යක් සිදු වනවා නම් එම ප්‍රදේශයේ මහජන නියෝජිතයින් දැනුවත් කළාද නැද්ද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය. මීට පෙර මුල්ගල තබන අවස්ථා වලදී ද මා හට දැනුම් දුන්නේ නැති අතර මෙලෙස කටයුතු සිදු වූ මුල් අවස්ථාව මෙය නොවේ.

**<u>ගරු මන්ත්‍රී ආර්.ගනේෂමූතර්ී මැතිතුමා</u>**

එම අවස්ථාවට අප සහභාගි වුවද නිසි පිළිගැනීමක් සිදු වූයේ නැත.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

සභාවේ මූලිකත්වයෙන් යම් උත්සවයක් පවත්වනවා නම් මඩොල්සිම ප්‍රදේශයේ ගරු මන්ත්‍රිවරුන් හට පමණක් නොව සියලුම ගරු මන්ත්‍රිවරුන් දැනුවත් කළ යුතුය. මීට කළින් එම ක්‍රමවේදය සිදුවූ නමුත් එම තත්ත්වය මේ වන විට මගහැරෙමින් පවතිනවා. කාල පරතරයත් සහිතව ඒ පිළිබඳව දැනුම් දිය යුතුය. පෙර පාසල් උත්සවයකට හෝ අප හට ආරාධනා කරන්නේ නැත. නමුත් පෙර පාසල් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරිමට අවශ්‍ය සහයෝගය සභාවේදි නොපිරිහෙළා ඉටු කරනු ලබනවා.

මට නැතත් අනෙක් සියලු මන්ත්‍රිවරුන්ට දැනුම් දිය යුතුය. මේ පිළිබඳව සභා ලේකම්තුමියට ද විශේෂ වගකීමක් පවති.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

දැනට මැටිගහතැන්න මහජන පුස්තකාලයේ සේවය කරනු ලබන ස්ථිර සේවක පි.සමන්තිනි මහත්මියට මඩොල්සිම මහජන පුස්තකාලයේ වගකීම ලිඛිතව පැවරිය යුතුය. එසේම කායර් මණ්ඩලය කළමනාකරණය කිරිමේදී ලුණුගල මහජන පුස්තකාලයේ සේවයේ නියුතු නිළධාරින් හා සේවකයින් මඩොල්සිම සේවයේ යෙදවීම ප්‍රායෝගික නොවේ.කාලය හා ප්‍රවාහන අපහසුතා ඊට ප්‍රධාන හේතුව වේ.

එසේ සේවයේ යෙදවීම තුලින් එක් ස්ථානයක හෝ රාජකාරි වගකීමකින් යුතුව නිළධාරින්ට ඉටු කළ නොහැකි වේ. ලුණුගල සිට මඩොල්සිම ප්‍රදේශයට රාජකාරි සඳහා ළගා වන විට පෙ.ව.10.00 පමණ

වන අතර ප්‍රවාහන අපහසුතා හේතුවෙන් මඩොල්සිම ප්‍රදේශයෙන් ප.ව.2.00 ට පමණ ලුණුගලට පැමිණීමට සේවා ස්ථානයෙන් බැහැර විය යුතුය. එසේ රාජකාරි ඉටු කිරීම ඵලදායි නොවේ. මේ හේතුව මත එක් ස්ථානයක හෝ වගකීමකින් යුතුව රාජකාරි ඉටු කිරීමට හැකියාවක් නොලැබේ. එබැවින් අදාළ ප්‍රදේශයේ පදිංචි නිළධාරීන් අදාළ ස්ථානයේ සේවයේ යෙදවීම තුලින් ඵලදායි සේවයක් ජනතාව වෙත සැළසිය යුතුය.

**04. කල්දී ඇති ප්‍රශ්න :-**

**<u>04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

**04/1/1.** මා විසින් ඉදිරිපත් කළ සංදේශ සහ පැමිණිලි සියල්ලම අප්‍රේල් මස සිට 2022 මැයි 25 දක්වා කිසිම ක්‍රියාමාගර්යක් ගෙන නැත. ඒ පිළිබඳ ක්‍රියාත්මක විය යුතු අය වගකිව යුතු අය ක්‍රියාත්මක නැත. පිළිතුරු ලබාදෙන්න.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

සභා ලේකම්තුමිය ද සම්බන්ධ කර ගනිමින් හෙට දින මේ සම්බන්ධව සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු යොදන්නම්.

**<u>04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

**04/1/2.** ලුණුගල ප්‍රාදේශිය සභාව සතු සුමුදුගම බහුකායර් ගොඩනැගිල්ල 2022 අප්‍රෙල් සිට මැයි 25 දක්වා කුලියට ලබාදීමෙන් ලැබුනු ආදායම, ලබාගත් අය, ලබාගත් දිනය, බහුකායර් ගොඩනැගිල්ල සඳහා අනුයුක්ත කල අය, එම අයගේ රාජකාරි, රාජකාරි වේලාව ලිඛිතව දෙන්න. 2022 අප්‍රේල්, 2022 මැයි බහුකායර් ගොඩනැගිල්ලට ගිය සම්පූණර් වියදම (වැටුප්, දීමනා, විදුලිය, ජලය වෙනත් වියදම් වෙන වෙනම ලිඛිතව ලබාදෙන්න.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

ලිඛිතව ලබා දෙන ලදි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මාතෘ, අප්‍රේල් මස ජල සම්බන්ධ වාතර්ාවක් ලබා දී තිබෙන අතර එහි ගණනය කිරීමේ දෝෂයක් පවතිනවා. එසේම සභාවට අවශ්‍යා තොරතුරු සැපයීමේදී වඩාත් සැළකිළිමත් වන ලෙසත් මේ පිළිබදව සභා ලේකම්තුමියගේ අධික්ෂණය යොදන ලෙසත් දන්වා සිටිමි.

**05. කල්දී ඇති යෝජනා :-**

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/1.** නව වෙළඳ සංකීණර්යේ අංක 09 කඩකාමරය ඒ.එම්.විජේසිරි මහතා විසින් ටෙන්ඩර් ලබාගත් අතර, ඔහු 2021.12.16 වන දින හදිසි හෘදයාබාදයකින් මිය ගිය අතර, රු.1520730.30 ක ටෙන්ඩර් මුදලින් රු.1410182.57 ක මුදලක් ඔහු විසින් ගෙවා අවසන් කර ඇති අතර, ඉතිරි රු.110547.73 ක මුදල 2022.04.29 දිනට පෙර ගෙවන බවට ඔහුගේ බිරිඳ වන ඩී.එම්.චන්ද්‍රලතා මිය ලිපියකින් දැනුම් දුන්නද එය තවමත් ගෙවා අවසන් කර නොමැත. මේ පිළිබඳව පළාත් පාලන දෙපාතර්මේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර, සභාවේ උපදෙස් ලබා ගැනීමට යෝජනා කරමි.

එම

**<u>මාරසිරි සමරවීර මැතිතුමා</u>**

90% ආසන්න මුදලක් ගෙවා ඇති හෙයින් ඉතිරි මුදල ගෙවීම සඳහා සහන කාලයක් ලබා දිය යුතුය.

ඒ අනුව ඉතිරි මුදල් ගෙවීමට සහන කාලයක් ලබා දිය යුතු බවට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/2.** PF 7347 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් රු.26040.00 මුදලක් බදුල්ල සන්ෂයින් ඔටෝ සවරීස් ආයතන වෙත ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රි ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/3.** ප්‍රාදේශිය සභාව සතු වාහන ධාවනය සඳහා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු.57800.00 ක මුදලක් පස්සර විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/4.** ප්‍රාදේශිය සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් අප්‍රේල් මාසය සඳහා රු.103368.00 මුදලක් ලුණුගල ඉන්ධන පිරවුම්හලෙහි ආර්.එම්.නිමල් සෙනවිරත්න මහතා වෙත ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/5.** පස්සර විවිධ සේවා සමුපකාර සමිතියට අයත් IOC ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් රු.50000.00 මුදලක් තැන්පත් ලෙස තැබීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

කසල බැහැරලීම් කටයුතු ආදිය සිදු කරනු ලබන හෙයින් ඉන්ධන සංචිතයක් පවත්වා ගත යුතුයි. එසේම සභාවේ ඉන්ධන වියදම් ද යම් තරමින් හෝ පාලනයකට ලක් කල යුතුයි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

පස්සර IOC ඉන්ධන පිරවුම්හලෙන් ඕනෑම අවස්ථාවක ඉන්ධන නිකුත් කරනු ලබන අතර බදුල්ල ප්‍රදේශයේ රාජකාරි සඳහා සභාවේ වාහන වැඩි වශයෙන් ගමන් කරන අවස්ථාවන්හිදි හෝ එම ඉන්ධන ලබා ගත හැකි වීම ද වාසි සහගතය.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

පසුගිය දිනෙක පස්සර විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිතුමා විසින් ලුණුගල වෙළඳ සංගමයේ සභාපතිතුමාට පහරදීමක් සිදු කොට ඇති අතර දේශපාලන බලතල මත එලෙස කටයුතු කිරිම පිළිබඳව මාගේ දැඩි අප්‍රසාදය පළ කර සිටින අතර මින් ඉදිරියට හෝ එවැනි අකටයුතුකම් සිදු නොවීමට වගබලා ගත යුතුය.එසේම වගකිව යුතු නිළධාරියෙකු එලෙස නොමනා ලෙස හැසිරිම පිළිබඳව මාගේ බලවත් කණගාටුව ප්‍රකාශ කර සිටිමි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඒ පිළිබඳව දෙපාශර්වයෙන්ම කරුණු විමසා සිටියෙමි.

එම මුදල් තැන්පත් කිරිම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-**

**05/1/6.** ZA 5016 බැකෝ ලෝඩර් යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් රු.94749.52 ක මුදලක් කොළඹ ඇවොන් ස්මාටර් පුද්ගලික සමාගම වෙත යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

බැකෝ ලෝඩර් යන්ත්‍රය සේවා කිරිම් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරිමේදී ඊට අදාළ පැය ගණන ද සඳහන් කළ යුතු බවට කිහිප අවස්ථාවකදීම මා විසින් සඳහන් කරනු ලැබූ කරුණකි. එම තොරතුරු සභාවට ඉදිරිපත් නොකිරිමට යම් හේතුවක් තිබේද යන්න දැන ගැනීමට කැමතිය. වසරකට ආයතනයට ලක්ෂ 18 ක පාඩුවක් බැකෝ ලෝඩර් යන්ත්‍රය මඟින් සිදුවනවා.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එම අවස්ථාවේදීම අදාළ තොරතුරු සභාවට යොමු කරන ලෙස සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා**

සේවක වැටුප්, ඉන්ධන හා ඔයිල් වියදම් මෙන්ම 12 න් බෙදූ වාෂරීක ආදායම් බලපත්‍ර ගාස්තු හා රක්ෂණ ගාස්තු ඇතුලත් වාතර්වක් මාසිකව සභාගත කරන්න. ඒ තුලින් හෝ ආදායම් ඉපැයීමට උත්සහ ගනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/7.** RA 7619 අංක දරණ ට්‍රැක්ටර් රථයේ වාෂරීක රක්ෂණ වාරිකය රු.9833.40 මුදලක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය වෙත ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/8.** ලුණුගල ජනතාපුර බහු ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකර ඇති කඩකාමර 04 ටෙන්ඩර් කිරීමට 2022.05.18 දිනට ටෙන්ඩර් කරමුත් කිසිවකු විසින් අයදුම්පත් ලබානොගන්නා ලදී. ඉදිරි කටයුතු සඳහා මහා සභාවට ඉදිරිපත් කරන බව යෝජනා කරමි. (අවම ලංසු මුදල රු.550000.00)

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මේ පිළිබඳව සඳහන් කරමින් කුඩා අකුරින් මුද්‍රිත පෝස්ටර් ප්‍රදශර්නය ඵලදායි නොවන අතර බැනරයක් ප්‍රදශර්නය කිරිම තුලින් මේ පිළිබඳව ජනතාව වෙත පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත. ඒ සඳහා වැය වන වියදම මා විසින් දැරිමට අපේක්ෂා කරන අතර මෙලෙස මුදල් අවභාවිතා කරමින් සිදු කළ ඉදි කිරිම් වලට අදාළ ප්‍රථිපල මෙලෙස ලැබෙමින් පවතින බවත් සඳහන් කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

ටෙන්ඩර් ක්‍රමය ක්‍රියාත්මක නොකොට දෛනික කුලි පදනම මත වෙළඳසැල් ලබා දීම පිළිබඳව මාගේ විරෝධතාවය පළ කර සිටිමි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි. අනුර වික්‍රමතුංග මැතිතුමා මැතිතුමා</u>**

ගියවර සභා කාලයේදී ( 2011 – 2018) ටෙන්ඩර් ක්‍රමවේදය නිසිලෙස සිදු වූ නමුත් මෙම කාලයෙන් පසු එම ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු සිදු කිරිමක් දක්නට ලැබේ. එම තත්ත්වය කණගාටුවට කරුණකි.

**<u>ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා</u>**

මින් පසු ටෙන්ඩර් ලබා දීමේදී ලුණුගල බල ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයින් හට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර ඉන් අනතුරුව බාහිර පාශර්වයන් වෙත අවස්ථාව ලබා දිය යුතුය.

එම ඉදිරි කටයුතු වෙනුවෙන් සභා ගත කළ එම යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/9.** ලුණුගල නව වෙළඳ සංකීණර්යේ බිම්මහලේ ඉදිකර ඇති අංක13, 14 කඩකාමර 02 2022.05.18 දිනට ටෙන්ඩර් කරමුත් කිසිවකු විසින් අයදුම්පත් ලබානොගන්නා ලදී. ඉදිරි කටයුතු සඳහා මහා සභාවට ඉදිරිපත් කරන බව යෝජනා කරමි. (අවම ලංසු මුදල රු.550000.00)

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

ලුණුගල නව වෙළඳ සංකීණර්යේ බිම්මහලේ වෙළඳසැල් ඉදි කිරිම පිළිබඳව එදත් අදත් මාගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටින අතර ජනතාවට ආකශර්නීය ලෙස පිවිසුම් මාගර් සකසමින් අලංකරණ ක්‍රමෝපායන් උපයෝගි කරගනිමින් එම ගොඩනැගිල්ල සැකසිය යුතු බවයි මගේ හැඟිම. ඒ සඳහා වෙළඳසැල් 03 ඉවත් කිරිම කළ යුතුය. පඩිපෙළ සකසා පාරිභෝගිකයින් හට පහසුකම් සැළසිය යුතුය.

එම ඉදිරි කටයුතු වෙනුවෙන් සභා ගත කළ එම යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/10.** ලුණුගල ප්‍රාදේශිය සභාවට අයත් පෙරපාසල් 06 හි ළමුන් සඳහා වතුර බෝතල් 56 ක් ලබාදීමට මිලගණන් කැඳවා අඩුම මිලගණන් ඉදිරිපත් කරන ලද බිබිල, ස්ටයිලෝ මෙගා සිටි ආයතන වෙත රු.8960.00 ක මුදල ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/11.** ෂෝලන්ඩ්ස් ශ්‍රී භද්‍රකාලි අම්මන් දේවාලයේ ප්‍රතිසංස්කරණ කිරීමේ කමර්ාන්තයේ වැඩ අවසන් වී ඇති බැවින්, 10% රඳවුම් මුදල ගිවිසුම් ගත සමිතිය වන විඩිවෙල්ලි ග්‍රාම සංවධර්න සමිතිය වෙත රු.28417.66 ක මුදල් ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/12.** 2021 වෂර්යට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාතර්ාව මේ වනවිට අදාළ නිලධාරින් විසින් සභාව වෙත භාර දී ඇති අතර, එය සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/13.** 2021 වෂර්යේ භාණ්ඩ සමීක්ෂණ වාතර්ාවේ නිදෙර්ශ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තක්සේරු කමිටුවක් පත් කර ගැනීම.

- භාණ්ඩා සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක්
- වාහන හා යාන්ත්‍රික කොටස හඳුනා ගැනීමට යාන්ත්‍රික ඉංජිනේරු කායර්ාලයේ කාමරීක නිලධාරියෙකු
- කායර්ාලයේ කාමරීක නිලධාරි මහතා
- සභික මන්ත්‍රීවරයෙකු
- ගබඩා විෂය නිලධාරී

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

තක්සේරු කමිටුවේ සභික මන්ත්‍රීවරයෙකු ලෙස ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා සුදුසු බවට යෝජනා කරමි.

එම කමිටුව සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/14.** 2021 භාණ්ඩ සමීක්ෂණ නිදෙර්ශ පරිදි අපහරණ/වෙන්දේසි කමිටුවක් පත් කිරීම

- භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු
- කායර්ාලයේ කාමරීක නිලධාරි මහතා
- සභික මන්ත්‍රීවරයෙකු
- ආදායම් පරීක්ෂක නිලධාරියෙකු
- ගබඩා විෂය නිලධාරී

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

අපහරණ/වෙන්දේසි කමිටුවේ සභික මන්ත්‍රීවරයෙකු ලෙස ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා සුදුසු බවට යෝජනා කරමි.

එම කමිටුව සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/1/15.** පවතින ඉන්ධන වියදම සළකා බලමින් බැකෝ ලෝඩර් යන්ත්‍රයේ පැයක් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධ සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරමි. (පැයක් සඳහා රු.6000.00 කි)

01. බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියදුරු සහිතව )

ඉන්ධන රහිතව කුලියට දීම රු. 3000.00

02. බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියදුරු සහිතව )

ඉන්ධන සහිතව කුලියට දීම - පහත මිල සූත්‍රය අනුව අය කෙරේ.

බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා පැයකට අය කරනු ලබන කුළි මුදල = යන්ත්‍ර ගාස්තුව + [ වත්මන් IOC ඉන්ධන මිල **X** 7.5 ]

උදාහරණ = 3000 + [400 X 7.5]

= 3000 + 3000

= 6000/-

ඉදිරියේදී ඉහත මිල සූත්‍රයට අනුව බැකෝ යන්ත්‍රය කුළියට දීමේ මුදල අය කරනු ලබන අතර, ඉදිරියේ දී ඉන්ධන මිල වැඩි වන අවස්ථාවේ දී ඊට සරිලන පරිදි වැඩි මුදලක් අය කොට පාඩුව පියවා ගැනීමටත්, ඉන්ධන මිල අඩු වන අවස්ථාවේ දී අඩු මුදලක් අය කොට ජනතාවට සහනයක් සැළසීමටත් හැකි වන ලෙස මෙම ගාස්තුව පනවා අයකරමි.

(බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීමේ දී නගර සීමාව තුළ ගමන් ගන්නා කාලයට අය කරන නොලබන අතර, නගර සීමාවෙන් පිටත සේවා ස්ථාන වෙත ගමන් කිරීමේ පමණක් ගණන් ගනු ලැබේ.)

එම යෝජනාව ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

අප ආයතනයේ බැකෝ ලෝඩර් යන්ත්‍රයේ වසරක අපේක්ෂිත කාලය (TARGET) පැය 300 කි. එය දින 365 න් බෙදූ පසු දිනකට අදාළ කාලය පොයින්ට් 75 ක් පමණ වේ. සේවක වැටුප් ගෙවීම් හෝ ආවරණය කිරිමට අවස්ථාවන් සොයා ගන්නා මෙන් රියදුරු හා සහයක දැනුවත් කළ යුතුය. දිනකට අවම වශයෙන් පැය 03 ක් සේවයේ යෙදිය යුතුය.

පවතින වියදම් සැළකිල්ලට ගනිමින් පැයක් සඳහා අය කරනු ලබන ගාස්තුව රු.6000.00 ක් ලෙස සංශෝධනය කළ හැකිය.

එම ගාස්තුව සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා :-**

**05/2/1.** ගෝල්ෆේස් ගෝඨාගෝගම නිපර්ාක්ෂිත අරගලකරුවන්ට සහ අරලියගහ මන්දිරය ඉදිරිපිට මයිනාගෝ ගම නිරායුද අහිංසක අරගලකරුවන්ට පහරදුන් මැරයන් කුපිතකරවූ මෙහෙයවූ පහසුකම් සැපයූ අය සහ පහරදුන් මැරයන් එම ප්‍රහාරය වලක්වා ගත හැකිව තිබියදීත් වලක්වා නොගත් ශ්‍රී ලංකා පොලිසියේ උසස් නිලධාරින් වහාම අත් අඩංගුවට ගන්න සහ එම කුපිත කිරීම නිසා රටේ සෑම පළාතකම සිදු වූ ප්‍රචන්ඩ ක්‍රියා වැලැක්වීමට ක්‍රියා නොකිරීම නිසා පොලිසියට අප්‍රසාදය පලකිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රි පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

මෙරට පොලිස් ස්ථානාධිපතිවරුන් 184 න් 182 ක්ම දේශපාලන හේතුන් මත තනතුරු ලබා ගත් අයවලුන් බව පොලිස්පතිතුමා විසින් ප්‍රකාශයක් කොට තිබෙනවා.පසුගිය දිනෙක නිපර්ාක්ෂික අරගලකරුවන් වෙත එල්ල කල අමානුෂික ප්‍රහාරය හේතුවෙන් සිදුවූ දේපල හා ජීවිත හානි සඳහා වගකිවයුත්තන් කව්ද යන්න ගැටළුවකි. කෙසේ නමුත් අප ප්‍රදේශයේ දේශපාලඥයින් හට කිසිදු හානියක් සිදු නොවිම පිළිබඳව සතුටට පත් විය යුතුය. කෙසේ වුවත් තරුණ අරගලකරුවන් වෙත සිදුකළ අමානුෂික ප්‍රහාරය තරයේ හෙලා දකින අතර මාගේ කණගාටුව ද පළකර සිටිමි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා :-**

**05/2/2.** රටේ අගමැති ඉල්ලා අස්වී දූපතක සිටින අවස්ථාවක ඉහලම උද්ධමනය අතින් දෙවන ස්ථානයට පත්වී සිටින මෙහොතක දූෂණය නිසා රට බරපතල ආර්ථික අබර්ුදයක තිබෙන අවස්ථාවක එක්සත් ජාතික පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරය භාර ගෙන ජනතාවට සහන ලබාදීමට ඉදිරිපත් වීම පිළිබඳව ලුණුගල ප්‍රාදේශිය සභාවේ සුභපැතුම් එක් කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රි එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

අතිගරු ජනාධිපතිතුමා අගමැතිධුරය භාර ගැනිම සඳහා මුලින්ම ආරාධනා කරනු ලැබුවේ විපක්ෂ නායකතුමාටය. එතුමා භාර ගත නොහැකි බව පවසා තිබේ. කෙසේ නමුත් මෙවැනි අවස්ථාවක සිය වගකීම අත්නොහරිමින් අගමැතිධුරය භාරගත් වත්මන් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තුතිය පිරිනමමි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

ගරු පාලර්ිමේන්තු මන්ත්‍රි චමල් රාජපක්ෂ මැතිතුමා පැවසූ පරිදි 2015 මහ මැතිවරණයෙන් පසු හිටපු ගරු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෞරවාන්විතව ඉවත් වූයේ නම් එතුමා අද වන්දනීය

පුද්ගලයෙකි. කෙසේ වුවත් සිය වගකීම අත්‍යාවශ්‍ය මොහොතක ඉටුකරලීම පිළිබඳව සභාවේ ස්තුතිය පිරිනමමින් වත්මන් අගමැතිතුමාට ලිපියක් යොමු කරන මෙන් ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී ඒ.එම්. ජයවීර අබේකෝන් මැතිතුමා.**

රටේ දැවෙන ප්‍රශ්න මුල් කරගෙන තරුණ දූ පුතුන් විසින් නිපර්ාක්ෂික අරගලයක් මෙහෙයවනු ලැබුවා එම අවස්ථාවේදි සිදුවූ අමානුෂික පහරදීම සම්බන්ධව මාගේ අප්‍රසාදය පළ කර සිටින අතර මෙම අබර්ුදයන් කාලාන්තරයක් පුරා මතුවෙමින් පැවති තත්ත්වයන් බව කිව යුතුමය. අප රට තුල ජීවත් වන පුද්ගලයින්ගේ ජීවත්විමේ අයිතිය අහිමි වෙමින් පවතින අවස්ථාවක් නිමර්ාණය වෙමින් පවති. අරගලය අවසානයේදී සිදුවිය යුතු දෙය නොවේ සිදු වුයේ.2019 මහ මැතිවරණයේදි ප්‍රතික්ෂේපිත පුද්ගලයෙකු අගමැතිධුරයට පත් කොට මේ වන විට වගකීම භාර ගෙන කටයුතු කරනු ලබයි.

විධිමත් ආථර්ික දැක්මක් සහිතව රට ගමන් කරනවාද යන්න ගැටළුවකි.එදා වු සිදුවිම හෙලා දකිනවා මෙන්ම එතැනින් එහාට ගමන් කරන දේශපාලන ගමන් මග පිළිබඳව සතුටුදායක තත්ත්වයක් දක්නට ලැබෙන්නේ නැහැ.අරගලකරුවන් සියලු දෙනාගේම බලාපොරොත්තුව වුයේ මෙතෙක් ආ ගමන් මග වෙනස් කොට නව මාවතකට පිවිසීමකට මඟ පෙන්විමයි.

පාලර්ිමේන්තුව තුලදී වුවත් මේ සඳහා නිශ්චිත වැඩ පිළිවෙලක් සකස් කළ යුතුව තිබුනද එය ද මේ වනතුරු සපුරා නොමැත.ගොවින්ගේ පොහොර සම්බන්ධ ගැටළුවද නොවිසඳුනු තත්ත්වයකි.ප්‍රවාහනය, සම්බන්ධ ගැටළුව, දෛනික ආහාර සපයා ගැනිමේ ගැටළුව ආදි ගැටළුකාරි තත්ත්වයන් ගණනාවක් ඉතිරිව තිබෙනවා. හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති ධුරයෙන් ඉවත් වු පසු අවස්ථාවක් තිබුනා පාලර්ිමේන්තුව තුල සියලුම දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කොට කෙටිකාලිනව වැඩ පිළිවෙලක් තුලින් දැවෙන ප්‍රශ්න වලට විසඳුම් ගැනීමට. ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා කතා කලා වගේ සුභපැතුම් එක්කිරිමට අපට හැකියාවක් නොමැත.

අද මධ්‍යම රාත්‍රිය පසුවන විට ජනතාවට දරාගත නොහැකි ලෙස ඉන්ධන මිළ ඉහල ගියා.රෝගි වු දරුවෙකු රෝහලට ගෙන යාමට නොහැකි තත්ත්වයක් මතුව තිබෙනවා.බස් ගාස්තු ද ක්‍රමයෙන් ඉහල යාමක් සිදු වනවා. එහි ප්‍රතිපලයක් ලෙස අද දින ද ඇතැම් මන්ත්‍රිවරුන් ප්‍රමාද වී සභා වාරයට පැමිණ තිබෙනවා.ඉතිං ජනතාව බලාපොරොත්තු වු වෙනස මෙයද යන්න ගැටළුවකි.

තිබු තත්ත්වයේම දිගුවක් පමණක් රටට ඉතිරිව තිබෙනවා.එම නිසා අපට සුභ පැතුම් එක් කිරිමට හැකියාවක් නැහැ.එදා වගේම ප්‍රමාණයෙන් විශාල කැබිනට් මණ්ඩලයක් අද පත් වි තිබෙනවා.තනතුරුද බෙදා දී තිබෙනවා. බොහෝ බේදනීය තත්ත්වයක් මතුව තිබෙනවා.ඊයේ රාත්‍රියේ කෘෂිකමර් අමාත්‍යතුමා පැවසු පරිදි මිනිසුන්ට හාමතේ මිය යන්නට වන කාලය වැඩි ඈතක නොවේ.

අරගලය සාමකාමි ලෙස අවසන් කිරිමට අවස්ථාව ලැබුනද එහි ප්‍රතිපලයන් ලෙස රට පුරාම ලැව් ගින්නක් ලෙස ප්‍රචණ්ඩත්වය පැතිරි ගියේය. මේවා මහජන මුදල්. කව්රු කොහොම මන්දිර හැදුවත් ඊට යටවී ඇත්තේ අහිංසක මිනිසුන්ගේ ශ්‍රමයයි. එම ශ්‍රමයට ලැබිය යුතු මුදල් තමයි මේවාට යොදවා ඇත්තේ. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුයි. මෙම ගැටළු මධ්‍යයයේ වත්මන් අගමැතිතුමාට සුභ පැතුම් එක් කිරිමට අප පක්ෂයක් වශයෙන් හැකියාවක් නොමැති බව අවසන් වශයෙන් ප්‍රකාශ කරමි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා :-**

**05/2/3.** ලුණුගල ප්‍රාදේශිය සභාව සතු බහුකායර් ගොඩනැගිල්ල තුල (බදුල්ල/මඩකලපුව A5 ප්‍රධාන පාරට මුහුණලා) ප්‍රදේශයේ ගොවීන්ගේ නිෂ්පාදන (කිතුල් පැනි/ හකුරු/තේකොල) අලෙවි සැලක් සහ කෙටි ආහාර/තේ පැන් අලෙවි කර ලුණුගල ප්‍රාදේශිය සභාවේ ආදායම එකතු කිරීමටත්,

එම ගොඩනැගිල්ලේ පිටුපස මුලුතැන්ගෙය ඉහල මහල සුබෝපභෝගි කාමර 04 ක් ඉදිකර අමතර ආදායමක් ලබාගැනීමට යෝජනා කරමි.

එක් කාමරයක් 1500 (සහන මිල) x 4 = දිනකට රු.6000.00

6000.00 x 30 = 180000.00 x 12 = 2160000.00

උපරිම ආයෝජනය = රු. ලක්ෂ 20 පමණයි.

**අලෙවි සැල**

දිනකට තේ කොල කිලෝ 100 ක් අලෙවි කලොත් 200 x 100 = දිනකට 20000.00

දිනකට 20000.00 x 30 = මසකම ලක්ෂ 6 යි.

වෂර්යකට ආසන්න වශයෙන් = 7200000.00

ආදායම වෂර්යකට හැත්තෑ දෙලක්ෂයයි.

උපරිම ආයෝජනය = රුපියල් ලක්ෂ 3 යි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

බහුකායර් ගොඩනැගිල්ල අසල කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ඇතුලත් වෙළඳසැලක් ආරම්භ කිරිමට ගල්වෙලගම ප්‍රදේශවාසින් දැනුවත් කළ හැකිය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

පසුගිය මාස වලදී ආදායමට වඩා වියදම වැඩි අගයක් ගෙන ඇත. ඒ පිළිබඳව සැළකිලිමත් විය යුතුය. එම ගොඩනැගිල්ල සුදු අලියෙකි. ප්‍රධාන මාගර්යට ආසන්නයේ වෙළඳසැලක් ඉදි කරන්න. ලුණුගල ප්‍රාදේශිය සභා ලාංඡනය සහිතව නිෂ්පාදන විකිණිය හැකිය.අඩු වියදමකින් වැඩි ආදායමක් ඉපැයිය හැකිය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා :-**

**05/2/4.** පවතින ඉන්ධන හිඟය අවම කර ගැනිමට විසදුමක් වශයෙන් අප සභාව සඳහා පා පැදි 02 ක් හා ගොනෙකු සහිත තිරික්කලයක් මිළදි ගැනිමට යෝජනා කරන අතර සභාවේ වාහන භාවිතය අවම කොට ඒ වෙනුවෙන් යතුරු පැදිය හා ත්‍රි රෝද රථය වැඩි වශයෙන් භාවිතයට ගන්නා ලෙසත් ඉල්ලා සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව පාපැදි 02 ක් මිලදී ගැනීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3. ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමාගේ යෝජනා :-**

**05/3/1.** අලුතින් ඉදි කරනු ලැබූ ඇකිරිය නව ගම්මානයේ නිවාස සඳහා වූ ජල ව්‍යාපෘතියට අදාළව මුදල් නිදහස් කර ගැනිමට අවශ්‍ය කටයුතු සළසා දෙන මෙන් යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
එම මුදල් ගෙවීම සඳහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**06. කාරක සභා වල වාතර්‍ා**

- **මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කමිටුව** - නැත
- **පරිසර හා පහසුකම් කමිටුව** - නැත
- **නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුව** - නැත
- **කාමරීක සේවා කමිටුව** - නැත

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාතර්‍ා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම**

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා**

ප්‍රාදේශිය සභාවකින් කඩිනමින් විපීරේඛා සහතිකයක් හෝ ලබා ගත නොහැකි බව පාලරීමේන්තු මන්ත්‍රී චාමර සම්පත් දසනායක මැතිතුමා වරෙක ප්‍රකාශ කරනු ලැබුවා. ලැබීම් වාතර්‍ාව සැළකු පසු මෙම මසට අදාළව විපීරේඛා තැන්පත් කිසිවක් ලැබි නොමැත. රු.500.00 ක් පමණයි ලැබි ඇත්තේ. එබැවින් ලබන සභා වාරයේ සිට සභාවට ලද විපී රේඵා සම්බන්ධ ලිපිගොනු ගණන කොපමණද හා ඉන් නිදහස් කරනු ලැබූ ලිපිගොනු ගණන කොපමණ ද යන්න සවිස්තරාත්මක වාතර්‍ාවක් ලබා දීමට කටයුතු කරන මෙන් සභා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිමි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

වෙනත් ආධාර යටතේ වැටුප් ප්‍රතිපුණර්ය යන්න දක්වන ලෙස සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා**

දඩ මුදල් සභාවට ලැබෙනවාද?

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

පළාත් සභාවට හෝ මුදල් ප්‍රතිපාදන ලබා ගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබෙන හෙයින් දඩ මුදල් ලැබෙන්නේ අවම වශයෙනි.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා**

ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා ප්‍රකාශ කළ පිරිදි බහුකායර් ගොඩනැගිල්ල හා බැකෝ ලෝඩර් යන්ත්‍රයෙන් ලැබෙන ආදායම වියදමට සාපේක්ෂව ඉතා අඩු අගයක පවතී.ආදායම් උත්පාදනයක් සිදු වන්නේම නැත. යම් හෙයකින් මුදල් අවශ්‍යතාවයක් මතුවුවහොත් ජල අංශයේ හෝ ස්ථාවර තැන්පත්

ගිණුමෙන් මුදල් ලබා ගනු ලබන මුත් ආදායම් මට්ටම වැඩි කිරිමට හෝ ආදායම් උත්පාදනය කිරිමට පියවර ගැනීමක් සිදු වන්නේ නැත.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

අද දින තක්සේරු කටයුතු සඳහා නිළධාරින් පැමිණෙන බව පවසා සිටියද අද දින නොපැමිණෙන බව පවසා සිටියා. තවද කඩ කාමර තක්සේරුවෙන් පසු ඊට අදාළ මුදල සභාවට ආදායමක් ලෙස ලැබෙනවා.ඉහල මහල මහජන බැංකුව වෙත ලබා දීම තුලින්ද ලක්ෂ 06 – 07 ක ආදායමක් ලැබෙනවා.තවද මඩොල්සිම ගොඩනැගිල්ලේ ඉහල මහල තුලින්ද ආදායම් ලැබිමට නියමිතය.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

ජනතාපුර වෙළඳසැල් ඉදි කිරිමේදීද මා විරුද්ධ වුවා. සංවධර්න ව්‍යාපෘති ක්‍රියාත්මක කළද එයින් සභාවට ආදායමක් ලැබෙන්නේ නොමැති නම් එයින් ඵලයක් නොමැත.එක් වෙළඳසැලක් කී වතාවක් ටෙන්ඩර් කිරිම් සිදු කරනවාද?ඒ පිළිබඳව සැළකිලිමත් විය යුතුය.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

2017 සිට මේ දක්වා බැකෝ ලෝඩර් යන්ත්‍රයේ සියලුම ආදායම් වියදම් සම්බන්ධ වාතර්ාවක් ලබන වාරයට ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

එක් එක් නිළධාරියාට විෂය පිළිබඳව වගකීම පැවරිය යුතුය. විශේෂයෙන් බහුකායර් ගොඩනැගිල්ල හා බැකෝ ලෝඩර් යන්ත්‍රයේ ආදායම වියදම් පවත්වාගෙන යාම පිළිබඳ වගකීම පැවරිය යුතුය. ජල ව්‍යාපෘතිය සැලකූ විට මාසික වැටුප් සඳහා රු.375000.00 ක මුදලක් වැය වේ. එම අගය වාෂරීකව ලක්ෂ 45 ට ආසන්න අගයකි. නමුත් ජල අංශයෙන් ලැබෙන ආදායම කිසිසේත්ම ප්‍රමාණවත් අගයක නොමැත. එය විශාල ගැටළුවකි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

සභාව වෙත යම් ආදායමක් ලද විට පමණයි ජනතාවට සේවයක් ඉටු කිරිමට අවස්ථාවක් ලැබෙනුයේ.එබැවින් සභා ලේකම්තුමිය මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. එසේම අද දින සභාවට යොමු කරනු ලැබූ ජල අංශයේ වාතර්ාවේ ගණිතමය දෝෂය පිළිබඳව මා සභාලේකම්තුමිය ද දැනුවත් කරනු ලැබුවා. එවැනි කටයුත්තක් හෝ කළමනාකරණය කර ගැනිමට නොහැකි වීම පිළිබඳව ජල අංශය වගකිව යුතුය.මාසිකව ලක්ෂ 02-03 ක පමණ හිඟයක් ඉදිරියට ගෙන යනු ලබන අතර එහි අවසාන ප්‍රථිපලය ඉතා භයානක තත්ත්වයකි.

මින්පසු සභාවට තොරතුරු සැපයීමේදී විශේෂ සැළකිල්ලක් දක්වන ලෙස ඔවුන් දැනුවත් කරන මෙන් සභා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පි.සුබ්‍රමනියම් මැතිතුමා</u>**

ලැබිම් වාතර්ාවේ දමිළ පරිවතර්නයේ දෝෂයන් තිබෙන හෙයින් ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනිමේදී මා ගැටළුකාරි තත්ත්වයකට මුහුණ දෙනු ලැබුවා.එසේම අප ආයතනයේ සේවයේ නියුතු සහා කටයුතු සිදු කරනු ලබන කායර්ාල කායර් සහයක සි.එන්.නිසා මහත්මියගේ ස්ථාන මාරුව අවලංගු කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

බැකෝ ලෝඩර් යන්ත්‍රය යනු ආදායම් ඉපැයිය හැකි මාගර්යක් වුවද මෙතරම් අලාභයන් සිදුවිම පුදුමසහගතය.පුද්ගලික අංශයේ බැකෝ ලෝඩර් යන්ත්‍රයන් ලුණුගල ප්‍රදේශයේ සේවයේ යෙදෙමින් විශාල වශයෙන් ආදායම් ලබන ආකාරය දක්නට ලැබෙනවා. වාෂරීකව ලක්ෂ 18 ක අලාභයක් ලබනවා නම් මෙම යන්ත්‍රය සඳහා මෙතරම් වැය කිරිමක් සිදු කිරිම ඵලදායි නොවන බවයි මගේ හැඟිම. මාසිකව සේවක වැටුප් සඳහා ලක්ෂයක මුදලක් වැය වනවා නම් ඔවුන් විසින් ආදායම් ලබා දීමේ අවස්ථාද සකසා ගත යුතුය. එබැවින් ලබන සභා වාරයේ සිට මාසික නඩත්තු වියදම්, ඉන්ධන හා නඩත්තු කටයුතු, වැටුප් පිළිබඳව සවිස්තර වාතර්ාවක් සභාගත කරන මෙන් සභා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා</u>**

බැකෝ ලෝඩර් යන්ත්‍රය වෙන් කොට මා වෙත හා ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා වෙත ලබා දෙන්නේ නම් එහි පුණර් වගකීම භාර ගැනිමට සුදානම්ය.එසේම ලාභ උපයාදීමටද කටයුතු කළ හැකිය. එහිදි ටයර් දැමිම්, සේවා කිරිම් හා රාජකාරි වලට යෙදවීම් ආදි සියලුම රාජකාරි අපගේ අධීක්ෂණය යටතේ සිදු කල යුතුය.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

පළමුවැනිදා සිට ලබා දීමට කටයුතු යොදන්නම්.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමාගේ අදහස පිළිබඳව මා සතුටට පත්වනවා. වතර්මානයේ මිනිසුන් ජීවත්වනුයේ ඉතා අපහසුවෙනි.අප කෙදිනක හෝ මෙම ආයතනයෙන් ඉවත්ව යන දිනෙක අපට දුක් වන්නට සිදු විය හැකි කරුණක් වන්නේ ආයතනයට ලැබිය යුතු ආදායම අහිමි වීමට දායක වීම නිසාය. සභා කාලය විසුරුවා හැරීමෙන් අප සියලු දෙනාහට නැවතත් සභිකයින් ලෙස නැවතත් තේරි පත් වීමට නොහැකි බව මා විශ්වාස කරමි. සභා ලේකම්තුමිය ඇතුලු නිළධාරි මණ්ඩලය අපට වඩා ආයතනය පිළිබදව හැඟීමෙන් කටයුතු කළ යුතුය.

තවද ආයතනයේ රාජකාරි සඳහා කුලි පදනම මත බැකෝ ලෝඩර් යන්ත්‍රයක් ලබා ගන්නේ නම් මීට වඩා ලාභදායි වනු ඇත.එබැවින් විධිමත් ලෙස මෙම යන්ත්‍රය නඩත්තු විය යුතුය. එසේම මේ තත්ත්වය වෙනස් නොවන්නේ නම් බැකෝ ලෝඩර් යන්ත්‍රය නවත්වා කසළ අංගනයේ රාජකාරි සඳහා කුලි පදනම මත බැකෝ ලෝඩර් යන්ත්‍රයක් ලබා ගැනිම සුදුසු බවයි මගේ හැඟිම.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

බැකෝ ලෝඩර් යන්ත්‍රයේ රියදුරු හා සහයක ඔවුන්ගේ හිතුමතේ රාජකාරි කළ නොහැකියි.ඔවුන් අප විසින් ඉදිරිපත් කරනු ලබන පොදු කාරණා යටතේ රාජකාරි කිරිමට අවනත විය යුතුයි.එසේ නොවුනහොත් ඔවුන්ගේ හිතුමතේ රාජකාරි කිරිමට පෙළඹුනහොත් මේ ගනු ලබන පියවර අපතේ යනු ඇත.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

මේ තත්ත්වය හොඳ ප්‍රවණතාවයකි.ගරු පාලරීමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කෝප් කමිටු සභාපතිධුරයේ කටයුතු කළ අවස්ථාවේ විශාල වැඩ කොටසක් සිදු වුවා.එබැවින් බැකෝ ලෝඩර් යන්ත්‍රය සම්බන්ධව මෙම මන්ත්‍රිවරුන් එක්ව ආයතනයට සිදු කිරිමට අපේක්ෂිත සත්කායර්ය පිළිබදව අවබෝධ කොට ගත යුතුය.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා</u>**

බැකෝ ලෝඩර් යන්ත්‍රය පැය 05 ක් සඳහා ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**2022 අප්‍රේල් මස ලැබීම්, ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ හා එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්ාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු යැය ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව එම වාතර්ාව සභා සම්මත විය.**

## 08. වෙනත් කරුණු

**<u>ජලය සම්බන්ධ ගැටළුව</u>**

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

මීට මාස 04-05ට පෙර මාගේ නිවසේ ජල මීටරයේ දෝෂයක් සම්බන්ධව කායර්ාලයට ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබුවා.ඒ අනුව සේවක මහතුන් පැමිණි අතර එහිදී ලීටර් 1000 ජල ටැංකියක් ජලයෙන් පිරිමේදී ලීටර් 1250-1300 ක් සඳහා අදාළ වන ඒකක ප්‍රමාණයක් වැය වන බව නිරික්ෂණය වන බව ඔවුන් පිළිගනු ලැබුවා.නමුත් අද වන තුරු ඒ සඳහා ගත් ක්‍රියාමාගර්යක් නොමැත.සභාවේ මහජන නියෝජිතවරයෙක් වශයෙන් කටයුතු කරනු ලබන මාගේ ගැටළුවට හෝ විසඳුම් නොදිම පිළිබදව මා කණගාටුව පළ කර සිටිමි.

මේ වන විට ජල පාරිභෝගිකයින්ගේ ගැටළු සහගත ජල මීටර් කොපමණ ප්‍රමාණයක් තිබෙනවාද? ගැටළු සහිත වු කොපමණ ප්‍රමාණයක් නැවත සකස් කරනු ලැබුවාද යන්න පිළිබදව සවිස්තර වාතර්ාවක් ලබන සභා වාරයට ලබා දෙන මෙන් සභා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිමි. එසේම ජල ප්‍රවාහය නල දිගේ පැමිණිමට පෙර සුළඟේ වේගයට ජල මීටරය ක්‍රියාත්මක වීමක් වනවා.ඒ වෙනුවෙන් වැය වන මුදල් ද ගෙවිය යුත්තේ අහිංසක ජල පාරිභෝගික ප්‍රජාව වනු ඇත.

අප මෙම ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට පෙර තීරණය කරනු ලැබුවේ මෙම ව්‍යාපෘතිය ඉදිකොට ඉන්ධන මඟින් හෝ විදුලියෙන් ක්‍රියාත්මක වනතුරු පැරණි ශාස්තු ක්‍රමය අනුගමනය කළ යුතුයි යන්නයි. ව්‍යාපෘතියේ ගොඩනැගිලි රජයේ වියදමින් ඉදි කළද ජලය ගබඩා කිරිමට හෝ ජලය සපයා ගැනීමට රුපියලක් හෝ ආයතනයෙන් වියදම් කරන්නේ නැත.හෘද සාක්ෂියට එකඟව එයයි සත්‍යය.

එම නිසා කඩිනමින් ජනතාවට විසඳුමක් ලබා දෙන්න. ජල හිඟය ඉවත් කිරිම පිළිබදව මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැත.එහි පීඩනය යොමු වන්නේ ජනතාව වෙතය.එම නිසා මෙම හිඟ ශාස්තු

ඉවත් කිරීම සඳහා නිශ්චිත කාලසීමාවක් තීරණය කළ යුතුයි.වහාම ඒ සඳහා කල් නොදමා විසඳුමකට යා යුතු කාලය එළඹ තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මෙම ව්‍යාපෘතියේ ජල මීටර් සවි කොට ඇත්තේ නිසි ක්‍රමවේදයකින් තොරවයි.මේ තාක් ජල සම්බන්ධතා ලබා නොදුන් ජල මීටර් බොහෝ ස්ථාන වල දක්නට ලැබෙනවා. මෙලෙස භුක්ති විඳිනු ලබන්නේ එම අවස්ථාවන් අධික්ෂණය සඳහා වගකිවයුතු නිළධාරියෙකු නොයෙදවීමේ ප්‍රතිපලයයි.කාණු කැපීම සඳහා බැකෝ ලෝඩර් යන්ත්‍රය යෙදවීම ද අවභාවිතාවකි. එය සොයා බැලිය යුතු තත්ත්වයකි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

ව්‍යාපෘතිය සඳහා 30% දායකත්වය ලබා දුන් ආකාරය විමසා මාගර් සංවධර්න අධිකාරිය වෙත ලිපියක් යොමු කරන මෙන් සභා ලේම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

ජල ව්‍යාපෘතිය සඳහා 30% දායකත්වය ලබා දිය යුතුයි. ඒ සඳහා කාමරීක නිළධාරි උපුල් සමන්ත මහතා විසින් ඇස්තමේන්තුවක් සකසනු ලැබුවා. එහිදි පැරණි ජල නල පද්ධතිය මැනුම් කටයුතු කර එහි වටිනාකම ලක්ෂ 1800 ක් අඩු කරනු ලැබුවා. එසේම බැකෝ ලෝඩර් යන්ත්‍රය ලබා දීමට හෝ කම්කරු මහතුන් සේවයට ලබා දීමට අප ගිවිසුම් ගත වී නොමැත.එයයි සත්‍යයය.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

අප එම මුදල් අය කර ගත යුතුයි. ඒ සම්බන්ධව කඩිනමින් වාතර්ාවක් කැඳවා සභා ගත කරන මෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

මෙම ජල ව්‍යාපෘතියේ ආරම්භයේ සිටම ගැටළුකාරි තත්ත්වයන් දක්නට ලැබෙනවා. එහි සැළැස්ම හෝ වියදම් ඇස්තමේන්තුව මේ දක්වා අප කිසිවෙකු දැක නොමැත. අපගේ දායකත්වය ලබා දුන් ක්‍රමවේදයක් දක්වා නොමැත.සභාව වෙත ගත්ත ද එහි 100% ක් වැඩ අවසන් කොට නොමැත.සැළැස්මක් නොමැතිව මෙහි අඩුපාඩු පෙන්වා දෙනුයේ කෙසේද යන්න ගැටළුවකි. එසේම හුලං වැල්ව තිබෙන්නේ කොතැනද යන්න හෝ අප නොදනී. තවද ව්‍යාපෘතියේ තනතුරු සඳහා බඳවා ගැනීම් ද ගැටළුකාරි වේ.

මේ සියල්ලේම අවසන් බර පැටවෙනුයේ අහිංසක පාරිභෝගික ජනතාව වෙතය. කායර්ාලයේ ජල අංශයෙහි ආදායම සෘණාත්මකවයි ගමන් කරනුයේ.සම්මත ක්‍රමවේදයකට අනුව තාක්ෂණික වාතර්ාවක් කැඳවා පැරණි හිඟ මුදල් කපා හැරිය යුතුය. මෙම පවතින ක්‍රමවේදය අනුව ජල බිල්පත නොගෙවු විට ජල සම්බන්ධතා විසන්ධි කිරිමේ ක්‍රමයක් හෝ දක්නට නොමැති වීම පුදුමසහගත කරුණකි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

දැන් පවතින අගයට (Rate) අනුව පැරණි බිල්පත් සකසන මෙන් උපදෙස් දී තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

ඒ සඳහා දින වකවානු තීරණය කොට තිබෙනවාද?

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

ජල ව්‍යාපෘතියේ අධික්ෂණ නිළධාරින් සමඟ සාකච්ඡා කිරීම ඵල රහිත ක්‍රියාවකි.ඔවුන් හැසිරෙනුයේ වගකීම් විරහිත පුද්ගලයින් ලෙසය. එසේම මෙම ව්‍යාපෘතියේ ප්‍රගමණය වෙනුවෙන් ආයතනික මට්ටමින් පවතින සාකච්ඡාවන් සඳහා පමණක් මා සහභාගි වන බව වගකීමෙන් යුතුව කිවයුතු කරුණකි. එසේම ව්‍යාපෘතියේ පවතින අක්‍රමිකතා පිළිබඳව පෙත්සමක් ගොනු වු හොත් එහි කටයුතු කරනු ලබන බොහෝ නිළධාරින්ට රැකියා අහිමි වීමේ ප්‍රවණතාවය නොවැළැක්විය හැකි කරුණකි. ඇතැම් ස්ථාන වල ජල නල එළිම සඳහා පොළොව අඩි 03 ක් කැපිය යුතු වුවද කපා ඇත්තේ අඩි 1 ½ කි. බොහෝ ස්ථාන එලෙස ගැටළු පවතින බවත් වගකීමෙන් යුතුව ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ පිළිබඳව ඌව පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කොට ලිපියක් යොමු කරන මෙන් සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

ආණ්ඩුකාරතුමාගේ පූණර් අනුමැතිය මත පමණක් හිඟ ජල ගාස්තු කපා හැරිය යුතුය. මෙම මුල්ම ගැටළුවට හේතු වූයේ සභාව නොමඟ යවමින් අනුමැතිය ලබා ගැනිමට කටයුතු කළ එවකට සභා ලේකම් තනතුරේ කටයුතු කළ ප්‍රසංග නලින් මහතාය.

එසේම ලබන සභා වාරයට මෙම ව්‍යාපෘතියේ සැළැස්ම හා වියදම් ඇස්තමේන්තුව හා ව්‍යාපෘති බල ප්‍රදේශයෙන් පාක්වත්ත කොටස ඉවත් කිරීම සම්බන්ධ විස්තර සභා ගත කළ යුතුය. මේ හේතුවෙන් මාගර් කඩා දැමුවා.තාප්ප හානියට පත් වුවා. ඒවාට දුන් විසඳුම කුමක්ද?

එසේම වසර 40 ක් ජල පරිභෝජනය කරනු ලැබූ මාගේ නම ජල පාරිභෝගික නාම ලේඛණයේ දක්නට නොලැබීම කණගාටුවට කරුණකි. අසල්වැසි නිවසේ ජීවත් වන ගුරුවරියකගේ නමෙහි කොටසක් එම ජල පාරිභෝගික නාම ලේඛණයේ දක්නට ලැබුනා. විශේෂයෙන්ම පැවසිය යුතු කරුණක් වන්නේ ජල පාරිභෝගිකයින් හට ගරුත්වයක් ලබා දිය යුතුයි යන්නයි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

මෙම ව්‍යාපෘතියේ පවතින අක්‍රමිකතා පිළිබඳව පෙත්සමක් අත්සන් කරනවා නම් ඊට මුලින්ම අත්සන් තැබීමට මා පසුබට වන්නේ නැත. එසේම එහි වන කරුණු ඔප්පු කිරීම සම්බන්ධව ගැටළුවක් හෝ නොහැකියාවක් මා හට නොමැත. ලබන සභා වාරය වන විට මෙම ව්‍යාපෘතිය සිදු කර ගෙන යනු ලබන්නේ කෙසේද? හිඟ අය කර ගනු ලබන්නේ කෙසේද හා ජනතාව වෙත ලබා දුන් සහනය කුමක්ද යන්නත් පැහැදිලිව ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මේ සඳහා අමාත්‍යාංශ මට්ටමින් විමශර්නයක් සිදු කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

සම්මත ජල නල පද්ධතියක් එළිය යුතු ක්‍රමවේදයෙන් බැහැරවයි මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු වී තිබෙන්නේ.එය පැහැදිලිවම දක්නට ලැබෙන තත්ත්වයකි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

පසුගිය දිනෙක ජල ගාස්තු වැඩි වීම පිළිබඳව පැවති උද්ඝෝෂණයේදී ඔබතුමා පැවසුයේ කඩිනමින් හිඟ ජල ගාස්තු කපා හරින බවයි. එසේම අප කායර්ාලයේ සේවක මහතෙකු වෙත දෙලක්ෂ ගණනක ජල බිල්පතක් ලැබී තිබෙනවා.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

රු.75000.00 ක ජල බිල්පත අවම වශයෙන් රු.25000.00 දක්වා හෝ අවම වුවහොත් පාරිභෝගිකයින් ගෙවීම් සිදු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

බොහෝ නිවෙස් වල මීටර් කණු සවි කොට ඇත්තේ ඉඩම මායිමේ වන බව පස්සර ප්‍රාදේශිය සභාවේ කාමරීක නිළධාරි නන්දන මහතා දිනෙක පවසා සිටියා. මේ හේතුවෙන් මීටර් කණුවට ඇතුලතින් යම් බිඳ වැටීමක් සිදු වුවහොත් ශබ්දය තුලින් හෝ එය පාරිභෝගිකයින් වෙත දැන ගැනීමට හැකියාවක් නොමැත.

බොහෝ විට ජල මනු කියවීමේ පහසුව පිණිස එලෙස ඉඩම මායිමේ මීටර් කණු සවි කර තිබුනද එයින් පාරිභෝගිකයින් හට විශාල ලෙස ගැටළුකාරි තත්ත්වයන් ඉස්මතු වන බව දක්නට ලැබෙනවා. මිනිසුන්ගෙන් ආදායම් ලබා ගැනීමට පෙර ඔවුන් වෙත ලබා දෙන සේවාව විධිමත් කළ යුතුයි. මිනිසුන් දැඩි අපහසුතාවයන්ගෙන් පිරි කාලයක් මේ වන විට ගෙවන හෙයින් ඔවුන් වෙත විශාල වශයෙන් බර පැටවීම සිදු නොකල යුතු බවයි මගේ හැඟිම.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ වන විට එලෙස පැමිණිලි ලැබී තිබෙන ස්ථාන වල මීටර් කණු නිසි ලෙස ස්ථාපිත කොට තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

පසුගිය සභා වාරයකදී ගරු මන්ත්‍රි පි.ලෝගනාදන් මැතිතුමා ද එක්ව මා විසින් යෝජනා කරනු ලැබුවේ පූජනීය ස්ථාන වෙත ජලය ලබා දීමේදි ඒකක 75 ක් නිදහස් කොට බිල් කිරීම් සිදු කරන ලෙසයි. නමුත් මේ වනතුරු එම යෝජනාව ක්‍රියාත්මක වි නොමැත.ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ පිළිබඳව විෂය නිළධාරින් දැනුවත් කරන මෙන් සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

ඇතැම් පාරිභෝගිකයින්ගේ ජල බිල්පත 3/1 ක් ගෙවීමට දැනුම් දුන්නද රු.75000.00 ක වැනි බිල්පතක් හිමි අයෙකු දැඩි අපහසුතාවයකට පත්වීම මෙම කාලය අනුව සාධාරණය.මෙලෙස හිඟ එකතු වූ විශේෂ කාලයක් (මාස 02 ක් වැනි) තිබුනේ නම් එම කාලයන් පිළිබඳව සාකච්ඡා කොට තීරණයක් ගත යුතුය. ඊට පෙර මාස වලට සාපේක්ෂව එම ගණනය කිරීම් සිදු කළ හැකිය.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

වැඩි කල් නොදමා එම සාකච්ඡාවන් අද සභා වාරයෙන් පසු සිදු කිරිමට කටයුතු කළ හැකි නම් වඩාත් සුදුසුය.

**<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා</u>**

මේ පිළිබඳව අවස්ථා කිහිපයකදීම සාකච්ඡා කරනු ලැබුවද ඊට ලබා ගත් පැහැදිලි විසඳුමක් දක්නට නොමැති වීම කණගාටුවට කරුණකි. උද්ඝෝෂණයෙන් පසු ජල බිල්පත අය කරනු ලබන ආකාරය ද අප වෙත සභාවෙන් පැහැදිලි කරනු ලැබුවා. නමුත් එලෙස අය කරනු ලැබුවේ ද නැත.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එලෙස සාකච්ඡා කිරීම් වලදී ලබා ගත් තීරණයන් මත මේ වන විට ජල බිල්පත අය කරනු ලබයි. එම අගයන් සඳහා පාරිභෝගිකයින් කැමැත්ත පළ කර සිටින අතර ගෙවීම් කටයුතු ද සිදු කර ගෙන යනු ලබයි.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා**

මේ මස ජල බිල්පත සමඟ අද දින ලබා ගනු ලබන තීරණයන් ජල පාරිභෝගිකයින් වෙත දැනුවත් කළ හැකිය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

මෙම ගැටළුව ඇති වීමට මුල් වූයේ මාස කිහිපයක ජල බිල්පත් එකවර ජනතාව වෙත යොමු කිරීම හේතුවෙනි. ජල අංශයේ කාර්ය මණ්ඩලය 15 ක් සිටියදී මුල් මාසයේ ජල බිල්පත නිකුත් නොකිරීමට කටයුතු කිරීම පිළිබඳව මාගේ අප්‍රසාදය පළ කර සිටිමි.ගෙවීමකින් තොරව ලැබෙන ජල සම්පත විධිමත් පරිදි කළමනාකරණය කර ගත නොහැකි නම් මෙම ආයතනය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

අද දින මේ සම්බන්ධව තීරණයක් ගන්නා හෙයින් ගරු මන්ත්‍රී මණ්ඩලය සියලු දෙනාම ඒ සඳහා සහභාගි වන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

ලුණුගල පොදු වැසිළියද ආදායම් උත්පාදන අවස්ථාවක් නොවේ. එම ස්ථානයට කාපට් 03ක් හා මල් පෝච්චි කිහිපයක් හෝ ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.එසේම හොඳ තත්ත්වයේ පවතින අනෙක් වැසිකිළියද විවෘතව තැබිය යුතුයි.

**ගරු මන්ත්‍රී ආර්.ගනේෂමූතර්ි මැතිතුමා**

2021 සභා අරමුදලින් රු.170,000.00 ක වියදමින් මඩොල්සීම ප්‍රදේශයේ නාන තොටුපළක් ඉදි කරනු ලැබුවා. නමුත් බිල්පත් සකසා ඇත්තේ රු.90,000.00 ක් සඳහාය. එසේම රැඳවුම් මුදල් ද ලබා ගත යුතු බැවින් කඩිනමින් එම ගැටළුව විසඳා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා**

මඩොල්සීම නගරයේ ජලය සම්බන්ධ ගැටළුවක් පවතින බැවින් කඩිනමින් එය නිරාකරණය කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

අද දින සභා වාරය අවසානයේදී කාමරීක නිළධාරිතුමා සමඟ සාකච්ඡාවක් පවත්වා විසඳුමක් ලබා ගත හැකිය.

**ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා**

ඊයේ රාත්‍රියේ මා හැටන් ප්‍රදේශයේ සිට නිවසට පැමිණෙමින් සිටියදී ගැටළුවකට මුහුණපාන්නට සිදු විය.මඩොල්සීම ප්‍රදේශයේ පිරිසක් නගරයේ ඉඩම් කොටසක් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන වෙළඳසැල් ඉදි කර ඇත. මීට පෙරද මා විසින් සභා ලේකම්තුමියගෙන් විමසා සිටියේ මෙම ඉඩම් කොටස සභාව සතු වනවාද එසේ නොමැතිනම් LRC සතුවනවාද යන්න. ඒ සඳහා පිළිතුරු ලබා දුන්නේ නැත.ඒ සඳහා අවසර ලබා දීම පිළිබඳව ගැටළුවක් පවතිනවා.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මෙම ඉඩම් කොටස සම්බන්ධව මැදිහත් වී විසඳුමක් ලබා ගැනීමට යාමේදී හිටපු ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය චාමර සම්පත් මැතිතුමා සමඟද ගැටළුවක් ඇති විය.එබැවින් ඒ සඳහා මා මැදිහත් නොවේ. එසේම මා දන්නා කරුණක් වනුයේ වැසිකිළියට අදාළ ඉඩම් කොටස සභාව සතු වන බව පමණකි.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

මඩොල්සීම ප්‍රදේශයේ මහජන නියෝජිතයින් ලෙස ගරු මන්ත්‍රීවරුන් මෙම අවස්ථාවේදී වගකීමෙන් යුතුව හැසිරිය යුතුය. තවද අවශ්‍ය නම් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කළ හැකිය.පොදු දේපල පනත යටතේ නඩු පැවරිය හැකිය.

**ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා**

ගරු සභාපතිතුමාට හා සභා ලේකම්තුමියට මේ සම්බන්ධව නීතිමය වශයෙන් කටයුතු කළ හැකිය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

සභා ලේකම්තුමිය විසින් මේ සම්බන්ධව මඩොල්සීම පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කිරීම කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා</u>**

මා කිහිප දිනකදීම දුටුවා සභා ලේකම්තුමිය ප්‍රවාහන අපහසුතා මධ්‍යයේ වුවද සිය රාජකාරි සඳහා පැමිණෙන ආකාරය.එතුමියට හිමි නිල රථය ලබා දිය යුතු අතර ඒ සඳහා සභාවේ පූර්ණ අනුමැතිය ද හිමි වන බව පැවසිය යුතුය.ක්ෂේත්‍ර අධ්‍යනයන් සිදු කිරිමටද වාහනය භාවිතා කළ හැකිය.මේ වනතුරු එතුමිය නිල වාහනයක් සම්බන්ධව ඉල්ලීම් කොට නැත. අවම වශයෙන් පස්සර ප්‍රදේශය දක්වා හෝ නිල රථය ගමන් පහසුව සඳහා එතුමියට ලබා දිය යුතුය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

එවිට එතුමියට සේවයට වාතර්‍ා කිරිමේ ගැටළුවක් ද ඇති නොවනු ඇත.

**න්‍යාය පත්‍රය අනුව අද දින සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.**

**මීලග මහ සභා රැස්වීම 2022.06.23 වන දින පෙ.ව.10.00 ට පවත්වන බව දැනුම් දුනි.**

(සී.ජගත්චන්ද්‍ර දලුකොටුව),
සභාපති,
ප්‍රාදේශිය සභාව,
ලුණුගල